අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்

# OFFICE ON MISSING PERSONS

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

# ANNUAL REPORT

## 2022

*නො. 40, 03 වන මහල, බුත්ගමුව පාර, රාජගිරිය*

*இல.40இ 03ம் மாடி,இபுத்கமுவ வீதி,ராஜகிரிய*

*No. 40, Level 03,Buthgamuwa Road,Rajagiriya,*

# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

## වාර්ෂික වාර්තාව

## 2022

කෙටි යෙදුම් මාලාව

| | |
|---|---|
| CoA | දක්නට නොමැති බවට වූ සහතිකය |
| CoD | මරණ සහතිකය |
| CoI | විමසුම් කොමිසම |
| CTF | උපදේශන කාර්ය සාධක බලකාය |
| DNA | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව |
| EU | යුරෝපා සංගමය |
| GSP | වරණයන් පිළිබඳ පොදු ක්‍රමය |
| ICRC | ජාත්‍යන්තර රතු කුරුස කමිටුව |
| INGOs | ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය |
| MIA | ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ සහ බලහත්කාරයෙන් අතුරුදහන් කළ |
| MoFA | විදේශ අමාත්‍යාංශය |
| MoJ | අධිකරණ අමාත්‍යාංශය |
| MoU | අවබෝධතා ගිවිසුම |
| MSD | කළමනාකරණය සේවා දෙපාර්තමේන්තුව |
| NGOs | රාජ්‍ය නොවන සංවිධාන |
| OMP | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය |
| PC | ජනාධිපති නීතිඥ |
| RTI | තොරතුරු දැනගැනීමේ අයිතිය |
| SLIDA | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| UN | එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| UNWG | එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම |
| UNWGIED | බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම |
| WGIED | ස්වේච්ඡාවෙන් සිදු නොවන අතුරුදහන් වීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම |

පටුන

සභාපතිතුමාගේ පණිවුඩය ............................................................6

1. පෙරවදන ............................................................ 8

2. හැඳින්වීම ............................................................ 9

3. 2016 අංක14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ අරමුණ ..... 10

4. විධි නියෝගය ............................................................ 10

5. දැක්ම සහ ආයතනික ප්‍රමුඛතා (ක්‍රියාකාරී ප්‍රතිපත්ති) ............................................................ 11

6. ප්‍රාදේශීය පැවැත්ම: ............................................................ 12

7. වැඩසටහන් යාවත්කාලීනය ............................................................ 13

8. නීති ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකය ............................................................ 13

8.1 විමසුම් ක්‍රියාවලිය ............................................................ 15

8.2 අභියෝග ............................................................ 16

8.3 මෙතෙක් ප්‍රගතිය ............................................................ 17

9. දත්ත ඇතුලත් කිරීමේ ඒකකය ............................................................ 17

10. වින්දිත සහ පවුල් සහය ඒකකය ............................................................ 18

10.1 අතුරුදහන් පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍ර ............................................................ 20

10.2 VFS බාහිර සහයෝගය ............................................................ 20

11. මූල්‍ය සහ ප්‍රසම්පාදන ඒකකය ............................................................ 21

12. මානව සම්පත් සහ පරිපාලන ඒකකය ........................................................................ 21

12.1කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ........................................................................ 22

13. සන්නිවේදන සහ සම්බන්ධතා ඒකකය ........................................................................ 22

13.1 මාධ්‍ය සමග සම්බන්ධතා ........................................................................ 23

13.2 ඩිජිටල් මාධ්‍ය මත පැවැත්ම ........................................................................ 23

14. තොරතුරු දැනගැනීමේ අයිතිය........................................................................ 23

15. 2022 වසරේ අභියෝග ........................................................................ 24

16. ඇගයීම; ........................................................................ 24

17. විගණන ප්‍රකාශය ........................................................................ 25

## සභාපතිගේ පණිවුඩය

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) පිහිටුවීම අතුරුදහන් වූවන්ගේ ඉරණම පිළිබඳව සත්‍යය ස්ථාපිත කිරීමේ වැදගත් පියවරක් ලෙස සලකනු ලැබිණි අතුරුදහන් වූවන්ගේ ඉරණම අනාවරණය කිරීම සඳහා පැහැදිලි විධි නියෝගයක් සහිත නෛතික ක්‍රියා පටිපාටි හරහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත බලතල ලබා දී ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පාර්ලිමේන්තු සභාව මගින් නම් කරන ලද සාමාජිකයන් 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර වත්මන් සාමාජිකයන් පත් කරනු ලැබ ඇත්තේ සංක්‍රමණීය යුක්තිය පිළිබඳ නිපුණතාව සහ පළපුරුද්ද මත පදනම් වෙමිනි. දැඩි පරිශ්‍රමයක ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදන් වූවන්ගේ නාම ලේඛනය නිකුත් කිරීමට හැකි වූ අතර ඒ සම්බන්ධ පරීක්ෂණ ආරම්භ කරන ලදී.

මේ වසර තුළදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ක්ෂෙත්‍ර ගණනාවකින් ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර කාර්යාලය මෙහෙයුම්කරණය කිරීම සහ අතුරුදහන් වූවන්ගේ පවුල් හා සම්බන්ධ වීම ඒ අතරින් විශේෂ වේ. මීට අමතරව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ප්‍රධාන නෛතික සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ගණනාවක් සිදු කළ අතර පුද්ගල විමර්ශන සහ විමසුම් ඉහළ තලයකට ගෙන ආවේය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සංකේතාත්මක සිද්ධීන් ගණනාවකට අදාළ තොරතුරු විශ්ලේෂණය කර සකස් කරන ලදී. 2018 ජූනි මස සිට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සමූහ මිනීවළ 11 කැණීමේ නිරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කළ අතර එම ක්‍රියාවලිය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීමට පියවර යෝජනා කරමින් සහ මූල්‍ය ආධාර ලබා දෙමින් විමර්ශනයට සහාය විය. පැමිණිලි ක්‍රියාවට නැංවීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මෙම වාර්තාකරණ කාල සීමාව තුළ කිලිනොච්චියේ ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරන ලද අතර එමඟින් යොමු කිරීමේ සේවා සහ ඉදිරි විමර්ශන සඳහා පහසුකම් සැලසෙනු ඇත. නව එකතු කිරීමත් සමග අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතුව මේ වන විට ප්‍රාදේශීය කාර්යාල 5ක් ඇත. අතුරුදහන් වූවන් සහ අතුරුදහන් වූවන් සැමරීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස OMP විසින් ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන්ගේ ජාත්‍යන්තර දිනය සැමරීමේ උත්සවය අතථ්‍ය ලෙස අමාත්‍යවරුන්, සිවිල් සංවිධාන නියෝජිතයන්, අතුරුදහන් වූවන්ගේ සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ආගමන හා විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව (උපත් සහ මරණ), හානිපූර්ණ කාර්යාලය, අමාත්‍යාංශ සමග වැඩ සබඳතා ගොඩ නගාගෙන ඇති අතර ද්විත්ව ඇතුළත් කිරීම් සහ බහු පැමිණිලි සම්බන්ධ ගැටළු තුරන් කිරීම සඳහා ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කරයි. යුරෝපා සංගමයේ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සැදුම්ලත් දූත පිරිස, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා හමුවූ අතර වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) සඳහා වන ජාත්‍යන්තර සම්මුතීන් 27 සමග ශ්‍රී ලංකාවේ අනුගත වීම ඇගයීමට සාකච්ඡා පැවැත්වී ය. ක්‍රියාවලියේ සාර්ථකත්වයට සහ ප්‍රගතියට ඉමහත් දායකත්වයක් ලබා දීම පිළිබඳව නියෝජිත පිරිස සිය ප්‍රසාදය පළ කර තිබේ. ICRC කණ්ඩායම, රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව, පරිත්‍යාගශීලී ආයතන, තානාපති කාර්යාල සමග හමුවීම් පැවැත්වීම පසුගිය වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනයක් විය.

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය වී තිබේද යන්න සොයා බැලීම සඳහා පෙර කොමිෂන් සභා මගින් කරන ලද සොයාගැනීම් විභාග කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. එවැනි සොයාගැනීම් සිදුවී ඇත්නම්, වගවීම පිළිබඳ පසුගිය කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාවට නංවා තිබේද

යන්න සහ වගවීමේ අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා ඉදිරියේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවාදැයි සොයා බැලීම සඳහා කොමිසමට තවදුරටත් විධි නියෝග ලබා දී ඇත.

තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කටයුතු සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට සහ සියලුම පැමිණෙන හෝ නව පැමිණිලි පිළිබඳව පසු විපරම් කරමින් ඒවා නැවත සිදුවීම වැලැක්වීම පිණිස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් පියවර ගෙන ඇත. ඒ අනුව, පසුගිය මාස 12 තුළ වාර්තාවන් මගින් අනාවරණය වූයේ කිසිදු බලහත්කාරී අතුරුදහන්වීම් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් වාර්තා වී ඉ නොමැති බවයි.

කොවිඩ්-19 වසංගතය මගින් ඇති වූ බාධාවන් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව ඇති කිරීම පිණිස අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට සත්‍යය සඳහා ඇති අයිතිය සහ යුක්තිය තහවුරු කළ යුතු බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි. මේ සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ හවුල්කරුවන් විසින් ඉදිරි කොමිසම සහ එහි නිලධාරීන්ට එහි විධිනියෝගය පූර්ණ ලෙස ක්‍රියාවේ යෙදවිය හැකි වීම පිණිස ශක්තිමත් පදනමක් සකසා ඇති අතර අදාළ රාජ්‍ය නියෝජිතායතන සහ දෙපාර්තමේන්තු සමග එක් වී එහි කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්න දරයි.

සභාපති

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

## 1. පෙරවදන

ශ්‍රී ලංකාව තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම, අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ සංකීර්ණ සහ ගැඹුරු හැඟුම්බර ගැටළුව සම්බන්ධයෙන් කටයුතු කිරීමට රජය දක්වන කැපවීම නියෝජනය කරන සන්ධිස්ථානයකි. මෙම දීර්ඝ කාලීන ගැටලුවට මුහුණ දීම සඳහා ජාතියේ කැපවීම ඉස්මතු කරමින් 2016 අංක 14 දරණ අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල (ස්ථාපිත කිරීම, පරිපාලනය සහ කාර්යයන් ඉටුකිරීම) පනත (OMP පනත) 2016 දී පාර්ලිමේන්තුවේදී සම්මත විය.

ඵලදායි සහයෝගීතාවයේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, රාජ්‍ය නොවන සංවිධාන (NGOs) සමග ගිවිසුම් ඇති කර ගැනීමට හැකි වන ලෙස OMP පනතට සංශෝධනයක් 2017 දී හඳුන්වා දෙන ලදී. මෙම සංශෝධනයේ අරමුණ වූයේ කීර්තිමත් රාජ්‍ය නොවන සංවිධානවල නිපුණතාව සහ සම්පත් උපයෝගී කරගනිමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ හැකියාවන් සහ සබඳතාවන් පුළුල් කර ගැනීමයි.

2018 වසරේදී, ශ්‍රී ලංකාව තුළ සියලුම ආකාරයේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනය බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිල වශයෙන් ස්ථාපිත කෙරිණි. මෙම ආයතනිකකරණය, සීමිත තාවකාලික යාන්ත්‍රණ සහ විමර්ශන කොමිෂන් සභා වලින් ඉවත්ව ස්ථිර හා ස්වාධීන රාජ්‍ය ආයතනයක් දක්වා ගමන් කරමින් රජයේ ප්‍රවේශයේ මූලික වෙනසක් පෙන්නුම් කරයි,

පෙර යාන්ත්‍රණයන් විසින් වටිනා නිර්දේශයන් ඉදිරිපත් වුවද, තම ආදරණීයයන් සොයමින් සිටින විශාල පවුල් ගණනක් වෙතින් අපේක්ෂා කළ පිළිතුරු ලබා දීමට ඒවා අසමත් විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, ගැටුම්, දේශපාලනික අසහනය, සිවිල් ආරවුල් හා සම්බන්ධ අතුරුදහන් වීම් හෝ බලහත්කාරී අතුරුදහන් වීම්වලට ලක්වූ පුද්ගලයන්ගේ ඉරණම සහ සිටින ස්ථාන පැහැදිලි කරමින් මෙම ගැඹුරු සහ පුළුල්ව පැතිර පවතින වේදනාව සමනය කිරීමට අරමුණු කරයි.

පළමු සභාපති වූ ජනාධිපති නීතිඥ සාලිය පීරිස් සහ දැන් සභාපති ලෙස කටයුතු කරන මහේෂ් කටුලන්ද මහයාගේ මග පෙන්වීම යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, එහි කාර්යක්ෂමතාව සහ ප්‍රතිචාරාත්මක බව සහතික කිරීම සඳහා විවිධ පුනරාවර්තනයන් හරහා පරිණාමය වී ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි තෙවන අදියර ලෙස ශ්‍රී ලංකාවේ අතුරුදහන් වීම්වලින් බලපෑම් ලත් පවුල් සඳහා සත්‍යය, යුක්තිය සහ සංහිඳියාව ලබා දීමේ නියැලෙයි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සත්‍යය හෙළිදරව් කිරීමට සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සැනසීම ලබා දීමට කැපවී සිටී. මෙම වාර්ෂික වාර්තාව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ලැබූ ප්‍රගතිය, මුහුණ දුන් අභියෝග සහ තම විධිනියෝගය සැපිරීමට සහ මැනිය නොහැකි අහිමිවීම්වලින් දුක්විඳි අයගේ දෝමනස්සයන් අවසන් කිරීමට ඇති නොසැලෙන අධිෂ්ඨානය පෙන්වා දෙයි. .

2021 කාලය තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබුණු 6000+ පැමිණිලිවල විමසුම් ක්‍රියාවලිය සඳහා 2022 වසරින් වැඩි කාලයක් ගත කළේ ය. දැනටමත් ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් ඵලදායී පරීක්ෂණ පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය කාර්යාල දෙකෙන්ම පැමිණිලි භාර ගැනීම නවතා දමනු ලැබිණි.

පෙබරවාරි මාසයේදී පැමිණිලි ලබාගැනීම නතර කිරීමෙන් පසු සහ 2021 වසර අවසානයේ ආරම්භ කළ විමසුම් ක්‍රියාවලිය පෙරට ගෙන ඒමෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2022 වසරේදී විමසුම් මණ්ඩල 2000 කට අධික සංඛ්‍යාවක් සඳහා සත්කාරකත්වය දක්වමින් සක්‍රිය වසරක් ගත කළේ ය.

## 2. හැඳින්වීම

2016 අංක 14 දරණ අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල (ස්ථාපිත කිරීම, පරිපාලනය සහ කාර්යයන් ඉටුකිරීම) පනත[1] 2016 අගෝස්තු මාසයේදී ක්‍රියාත්මක කරනු ලැබුවේ, පවරා ඇති බලතල සහ කාර්යයන් සඳහා අදාළ ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ ගෙනහැර දැක්වීම, අතුරුදහන් වූවන් පිළිබඳ දත්ත ගබඩාවක් පිහිටුවීම, අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට උපකාර කිරීම, අතුරුදහන් වූවන් සෙවීම සහ සොයා ගැනීම සඳහා සහය ලබා දීම සහ OMP පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා සැපයීම සඳහා ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය[2] මෙම සහන කටයුතු සඳහා කැපවී සිටින අතර ඒ සඳහා සම්බන්ධීකරණය වී සිටී. 2018 පෙබරවාරි 28 වන දින, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත කොමසාරිස්වරුන් හත් දෙනෙකු පත් කිරීමත් සමඟ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ක්‍රියාත්මක විය.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ අරමුණු වන්නේ පුද්ගලයන් තුරුදහන් වූ තත්ත්වයන් පැහැදිලි කරගැනීම; නැවත සිදු නොවීම සහතික කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ සැපයීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතීන් හ අභිලාශයන් ආරක්ෂා කිරීම; අතුරුදහන් වූ තැනැත්තන් වෙනුවෙන් අවශ්‍ය සහන සැලසීම සඳහා මාවත් හඳුනාගැනීම; පවතින මූලාශ්‍රවලින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ දත්ත ලබාගැනීම සහ ලද හැකි සියලු තොරතුරු දත්ත පදනමක් තුළ මධ්‍යම කිරීම වේ.[3]

එමෙන්ම, OMP හට බලතල සහ කාර්ය භාරයන් ගණනාවක් පවරා ඇති අතර, දක්නට නොමැති බවට වන සහතියක නිකුත් කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට හැකිවන පරිදි අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට අතුරු වාර්තා නිකුත් කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට මනෝ සමාජයීය සහය ලබාදීම ඇතුළු සුබසාධන සේවාව සහ පරිපාලන සහය ලබාදීම හෝ ඒ සඳහා පහසුකම් සැපයීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට හානිපූරණයන් ලබාදීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ සැපයීම; වින්දිතයින් සහ සාක්ෂ්‍යකරුවන් අරක්ෂා කිරීම සඳහා ක්‍රම පද්ධතියක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සියලු විස්තර සහිත දත්ත පදනමක් නිර්මාණය කිරීම, කළමනාකරණය කිරීම සහ පවත්වා ගැනීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට සිදු වූ හානිය සහ ඔවුන් පත්වූ වේදනාකාරී තත්ත්වය සම්බන්ධව මහජන දැනුවත්භාවය සහ සංවේදීතාව ඇති කිරීම හා ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාගැනීමට සහ ආර්ථික, මනෝ සමාජයීය, නෛතික සහ පරිපාලන සහය වෙත පිවිසීම සහතික කිරීමට මහජනතාවගේ සහය ලබාගැනීමට පහසුකම් සැලසීම ඒ අතර වෙයි.[4]

OMP හට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සම්මතයන් සහ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම, කාර්ය මණ්ඩලය පත් කිරීම සහ ඉවත් කිරීම සහ එහි ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය පරිදි ඒකක ස්ථාපිත කිරීම යනාදිය සඳහා පුළුල් අධිකාරියක් ඇත.[5] තවද, අනාගත අතුරුදහන්වීම් වැලැක්වීම ඇතුළුව පුළුල් පරාසයක ගැටළු සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය අධිකාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට, අතුරුදහන් වූවන් සැමරීමේ සහ පිළිගැනීමේ මාධ්‍යයන් සහ ක්‍රම; හඳුනාගත නොහැකි සහ හඳුනාගත හැකි දේහය හැසිරවීම; අතුරුදහන් වූවන්ගේ ගැටළු පිළිබඳ තොරතුරු මහජන දැනුම සඳහා ප්‍රකාශයට පත් කිරීම; සහ අතුරුදහන් වූවන් සම්බන්ධ ජාතික නීති සහ රෙගුලාසි සංවර්ධනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට බලය ඇත.

---

[1] මින් මතු OMP පනත ලෙස හැඳින්වේ
[2] මින් මතු OMP ලෙස හැඳින්වේ
[3] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 10 , වගන්තිය
[4] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 13 , වගන්තිය
[5] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 11 , වගන්තිය

මෙම පනත මගින් OMP වෙත පැමිණිලි භාර ගැනීමට, පරීක්ෂණ ආරම්භ කිරීමට සහ අතුරුදහන් වූ පුද්ගලයකු සිටින ස්ථානය විමර්ශනය කිරීමට බලය ලබා දී ඇත. OMP ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම අයෙකුට සිතාසි නිකුත් කිරීම හෝ කිසියම් ලේඛනයක් හෝ වෙනත් අයිතමයක් ඉදිරිපත් කිරීම ඇතුළු කරුණු පරීක්ෂා කිරීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගැනීම; සංවේදී තොරතුරු හෝ කැමරාවේ ඇති තොරතුරු පිළිගැනීම සඳහා මෙන්ම රහස්‍යභාවයේ කොන්දේසි යටතේ තොරතුරු පිළිගැනීම සඳහා ක්‍රියා පටිපාටියක් නිර්මාණය කිරීම. නිරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කරමින් කැණීමක් හෝ ගොඩගැනීමක් සිදුකිරීමට අවසර ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට අයදුම් කිරීම; ඕනෑම රාජ්‍ය අංශයේ ආයතනයකින් අවශ්‍ය උපකාර ඉල්ලා සිටීම; වරෙන්තුවක් නොමැතිව ඕනෑම රැඳවුම් ස්ථානයක් සෙවීම; සහ නිසි සලකා බැලීමෙන් පසු අදාළ නීතිය බලාත්මක කිරීමට හෝ නඩු පැවරීමේ අධිකාරියකට සිදු කර ඇති වැරදි වාර්තා කිරීම.[6]

## 3. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ අරමුණු

පහත කරුණු සඳහ සියලු අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව තහවුරු කිරීම:

a) අතුරුදහන් වුවන් සෙවීම සහ සොයා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සැපයීම සහ එවැනි පුද්ගලයින් අතුරුදහන් වූ අවස්ථා පැහැදිලි කිරීම

b) පනතේ අර්ථය තුළ 'අතුරුදහන් වීමේ' සිදුවීම් අවම කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම;

c) පනතේ විධිවිධාන දක්වා ඇති පරිදි අතුරුදහන් වුවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම;

d) අතුරුදහන් වූ තැනැත්තන් හෝ ඔවුන්ගේ ඥාතීන්ට ප්‍රවේශ විය හැකි සහන ලබා ගැනීමේ නිසි මාර්ග සඳහා නිසි පිළියම් යෙදීම සඳහා මාර්ග හඳුනා ගැනීම;

## 4. විධි නියෝගය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පහත විධි නියෝගය ඇත;

a) අතුරුදන් වුවන් සෙවීම, සොයා ගැනීම සහ ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයන් හඳුනා ගැනීම සහ එවැනි පුද්ගලයන් අතුරුදන් වූ තත්ත්වයන් පැහැදිලි කිරීම;

b) අතුරුදහන් වීමේ සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම;

c) පනතේ විධිවිධාන දක්වා ඇති පරිදි අතුරුදහන් වුවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම;

d) අතුරුදහන් වූ පුද්ගලයන්ට සහ අතුරුදහන් වුවන්ගේ ඥාතීන්ට හිමිකම් ඇති සහන සැලසීමේ මාර්ග හඳුනාගෙන අතුරුදහන් වූ පුද්ගලයාට (ජීවත්වන විට හමුවුවහොත්) හෝ එවැනි අතුරුදහන් වූ පුද්ගලයාගේ ඥාතියෙකුට දැනුම් දීම;

[6] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත 12 , වගන්තිය

e) දැනට සිදුකෙරෙන ක්‍රියාවලීන් හෝ වෙනත් ආයතන, සංවිධාන, රාජ්‍ය දෙපාර්තමේන්තු විමසුම් කොමිසම කොමිෂන් සභා සහ විශේෂ ජනාධිපති විමසුම් කොමිෂන් සභා මගින් ලබාගන්නා අතුරුදහන් වූවන් පිළිබඳ දත්ත එක් රැස් කිරීමත් ඒවා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය යටතේ ස්ථාපිත දත්ත පදනමක් තුළ මධ්‍යගත කිරීම;

f) පනත යටතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි අනෙකුත් අවශ්‍ය සියලු දේ සිදු කිරීම.

එමෙන්ම, යම් කිසි පුද්ගලයෙකු අතුරුදහන් වූ වරක් කාලසීමාව නොතකා ඒ සම්බන්ධව ක්‍රියාත්මක වීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධි විධානය වෙයි.

## 5. දැක්ම සහ ආයතනික ප්‍රමුඛතා (ක්‍රියාකාරී ප්‍රතිපත්ති)[7]

දැක්ම සහ මෙහෙවර

| | | | |
|---|---|---|---|
| අපගේ දැක්ම | *සෑම කෙනෙකුම යුක්තිය භුක්ති විඳින, සංහිඳියා ක්‍රියාවලියෙන් පොහොසත් කරන රටක්.* | | |
| අපගේ මෙහෙවර | *ජාතික සංහිඳියා යාන්ත්‍රණයේ කොටසක් ලෙස අතුරුදහන් වූවන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.* | | |
| ප්‍රධාන ප්‍රතිඵල<br><br>අනාගතයේදී පුද්ගලයන් අතුරුදහන් වීම නැවත සිදු නොවීම සහ අතුරුදහන් වූවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම | ප්‍රතිඵලය 1: (අරමුණ)<br><br>වැළැක්වීමේ පියවර<br><br>වැළැක්වීමේ උපාය මාර්ග හරහා අතුරුදහන්වන්නන් සංඛ්‍යාව අඩු කිරීම, ළමුන්, තරුණයින් සහ වැඩිහිටියන් නැවත නැවතත් අතුරුදහන් වන අවස්ථාවන්හිදී දැනුවත් කිරීම සහ ඉක්මන් මැදිහත්වීම. | ප්‍රතිඵලය 2:<br><br>ආරක්ෂණ පියවර<br><br>නියෝජිතායතන විසින් අතුරුදහන් වූ දරුවන්, තරුණ පුද්ගලයන් සහ වැඩිහිටියන් සම්බන්ධ සිදුවීම් අනුව සැලසුම් කළ අවදානම් පදනම් ප්‍රතිචාරයන් සැපයීම තහවුරු කිරීම සහ පුද්ගලයා සොයාගෙන ප්‍රාදේශීය සහ ජාතික මට්ටමින් හැකි ඉක්මනින් සිදුවීම් අවසන් කිරීම. | ප්‍රතිඵලය 3:<br><br>පිළියම් විකල්ප සැපයීම<br><br>ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සහ සහය වෙත පිවිසීමේ ආකාරය පවුල් වෙත අවබෝධ කරවීම තහවුරු කිරීමෙන් අතුරුදහන් වූ පුද්ගලයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සහය සහ මගපෙන්වීම ලබා දීම |

[7] OMP උපාය මාර්ගික සැලසුම 2023-2025

## 6. ප්‍රාදේශීය පැවැත්ම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමස්ත රට පුරාම ක්‍රියාත්මක වන අතර එහි ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇත. එයට අමතරව ප්‍රාදේශීය සහ උප ප්‍රාදේශීය කාර්යාල පිහිටා ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ප්‍රාදේශීය කාර්යාල 12ක් පිහිටුවීමට විධි විධාන ලබා ඇති අතර වාර්තාකරණ කාල සීමාව තුළ කිලිනොච්චියේ ස්ථාපිත කරන ලද කාර්යාලය ඇතුළුව කාර්යාල පහක් ඇත.




ප්‍රාදේශීය කාර්යාල- මඩකලපුව
අංක 124, සෙන්ට්‍ර පාර, මඩකලපුව
දුර: 065-222-4532/4534

යාපනය- ප්‍රාදේශීය කාර්යාලය
අංක 124, අඩියාපතම් පාර, කල්වියාන්කඩු, යාපනය
දුරකථන අංකය 021-2219414/9400/9401

ප්‍රාදේශීය කාර්යාල- මන්නාරම
අංක 5, දුම්රියපොළ පාර,
මන්නාරම
දුර: 023-2222083 /ෆැක්ස්: 023- 2223929

ප්‍රාදේශීය කාර්යාල, මාතර
අංක 54, ධර්මාරාම පාර,
මාතර
දුර: 041- 2244684 / 041- 2224046

ප්‍රාදේශීය කාර්යාල- කිලිනොච්චිය
A9 පාර, අධිකරණය අසළ,
කිලිනොච්චිය,
දුර: 021-2219400

## 7. වැඩසටහන් යාවත්කාලීනය

සභාපති මහේෂ් කටුලන්ද මහතාගේ දැක්ම යටතේ OMP විසින් 2022 වර්ෂය සඳහා වූ උපායමාර්ගික සැලැස්ම නැවත සලකා බැලීමෙන් අනතුරුව 2022 වසර සඳහා OMP හි වැඩසටහන් උපාය මාර්ගය ලෙස පහත සඳහන් ලෙස සකස් කරන ලදී.

වැළැක්වීමේ පියවර - ළමුන්, තරුණයින් සහ වැඩිහිටියන් නැවත නැවත අතුරුදහන් වන අවස්ථාවන්හිදී ඒ පිළිබඳව දැනුවත් කිරීම සහ කලින් මැදිහත් වීම මගින් අතුරුදහන් වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව අඩු කිරීම.

ආරක්ෂණ පියවර - ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් හැකි ඉක්මනින් අතුරුදහන් වූ පුද්ගලයා සොයා ගැනීමට සහ පැමිණිලි අවසන් කිරීමට ප්‍රාදේශීය නියෝජිතායතන විසින් ඉලක්කගත, අවදානම් මත පදනම් වූ ප්‍රතිචාර ලබා දීම සහතික කිරීමෙන් අතුරුදහන් වූවන්ට හානි වීමේ අවදානම අඩු කිරීම.

පිළියම් විකල්ප සැපයීම - අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට ආධාර සහ සහාය ලබා ගන්නේ කෙසේද සහ කොතැනද යන්න අවබෝධ කර ගැනීම සඳහා ඉක්මනින් යොමු කිරීම සහ සහතික කිරීම මගින් අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා සහය සහ මඟ පෙන්වීම ලබා දීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත ලැබුණු වැඩි සහයෝගය සහ ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් සමගින් අත්සන් කරන ලද ගිවිසුම් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් වසර පුරා අනුගමනය කරන ලද අරමුණ සඳහා වූ කැපවීම පෙන්නුම් කරයි.

## 8. නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා ආර්ථික, මනෝ සමාජීය, නෛතික සහ පරිපාලනමය සහය ලබා ගැනීමට පහසුකම් සැලසීමේ විධි නියෝගයක් ඇත.[8] එමෙන්ම ඉදිරියේදී සිදුවන අතුරුදහන් වීම් වැලැක්වීම, මිනිස් මෘතදේහ සම්බන්ධව කටයුතු කිරීම සහ අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වල සමාජ සහ ආර්ථික තත්වයන් වැඩි දියුණු කිරීම යනාදිය ඇතුළු කරුණු ගණනාවක් සම්බන්ධව රාජ්‍ය ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.[9]

---


[8] OMP පනත, 2 (ආ): 10 (ඇ), 13) (ඉ) (ඊ)වගන්ති.
[9] OMP පනත, 13 වගන්තිය k)(i),(iii),(vii).

ඉහත විධි නියෝගය ක්‍රියාත්මක කිරීමේදී OMP විසින් CoA සම්බන්ධයෙන් නෛතික සහ ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් කළේ ය; CoA ලබාගැනීමට හැකි වන පරිදි අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වෙත අතුරු වාර්තා නිකුත් කිරීම; 2019 අයවැය වාර්තාව මගින් නිවේදනය කළ අන්තර්කාලීන සහන ක්‍රියාත්මක කිරීම; මිනිස් මෘත දේහ සම්බන්ධව විමසීමේ දී මහේස්ත්‍රාත් බලතල ක්‍රියාත්මක කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට කොවිඩ් සහන ලබාදීම සහ පුද්ගලයන්ගේ නෛතික සහ පරිපාලනමය ඉල්ලීම් වෙත ප්‍රතිචාර දැක්වීම.

2022 වසරේදී නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකය, වැඩි වශයෙන් විමසුම් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී. විමසුම් ක්‍රියාවලිය පහසු සහ ඵලදායී කිරීම පිණිස 2022 පෙබරවාරි තෙක් ලැබුණු පැමිණිලි සඳහා ඒකකය විසින් අදියර පදනම් වර්ගීකරණයක් භාවිතා කෙරිණි[10]. මෙම අදියරයන් පහත පරිදි වේ

1. අදියර 1 2000 න් පසු සියලු පැමිණිලි
2. අදියර 2 1980-2000 අතර පැමිණිලි
3. අදියර 3 1980 ට පෙර සියලු පැමිණිලි

1 වන අදියර පැමිණිලි බොහොමයක් මෑතකාලීන ඒවා වූ බැවින් ලේඛන බොහෝ දුරට නොවෙනස්ව සොයාගත හැකි බැවින් 2022 දී සිදු කරන ලද වැඩිම විමසීම් සංඛ්‍යාව ඉහත වර්ගීකරණයේ 1 වන අදියර තුළට අයත් වේ.. OMP විසින් 2022 දී අපගේ උප-ප්‍රාදේශීය ස්ථාන සහ ප්‍රධාන කාර්යාලය ආවරණය වන පරිදි විමර්ශන 2000 කට වඩා සාර්ථකව සිදු කරන ලදී. ඉදිරි වසරවලදීත් මෙම ඵලදායී ප්‍රයත්නයන් අඛණ්ඩව පවත්වා ගැනීමට OPM අදහස් කරයි.




රට වසංගත තත්වයෙන්, දීර්ඝ කාලීන වසා දැමීම්වලින් සහ නිරෝධායනයෙන් යථා තත්ත්වයට පැමිණීමෙන් සාමාන්‍යකරණය වන අතර OMP හට කොළඹින් පිට ස්ථානවල විමසුම් කිරීමට ඇති අවස්ථාව සැලකිය යුතු ලෙස වැඩි විය.

[10] OMP පනත, 12 වගන්තිය

### 8.1 විමසුම් ක්‍රියාවලිය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නෛතික, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකය, තොරතුරු ප්‍රවාහය සුමට කිරීම සඳහා පූර්ව විමසීම් සහ පශ්චාත් විමසීම් හැසිරවීමේ විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කළේය.

සහය ඒකකය විසින් වින්දිතයකු වෙනුවෙන් පැමිණිල්ලක් ගොනු කළ පසු, එම පැමිණිල්ල සඳහා නිශ්චිත ගොනුවක් වෙන් කෙරෙනු ඇති අතර එයට පැමිණිල්ලේ මූලික වාර්තාවක් සහ අදාළ අනෙකුත් ලේඛන ඇතුළත් වේ. ගොනුව, පැමිණිලිකරුගේ දිස්ත්‍රික්කය මත පදනම් වේ. විමසුමක් ආරම්භ කිරීමට පෙර දත්ත කළමනාකරණ ඒකකය විසින් මණ්ඩලයේ විභාග කිරීමේදී සලකා බැලෙන ගොනු ඉදිරිපත් කරනු ලැබේ. මෙම ගොනු නීති ඒකකය විසින් පරීක්ෂා කර සත්‍යායනය කෙරෙනු ඇති අතර එම ගොනු, විමසුම පැවැත්වෙන ප්‍රාදේශීය කාර්යාලය හෝ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කුරියර් මාර්ගයෙන් යවනු ලැබේ.[11] ඉහත ලෙස ගොනුවක් සැකසීමෙන් පසුව අදාළ පැමිණිලිකරුට විමසුම පිළිබඳව දන්වමින් ලිපියක් යවනු ලබන අතර ඉන්පසු සිහිකැඳවීම සඳහා දුරකථන ඇමතුමක්ද ලබා දෙනු ලැබේ.

විමසුම් මණ්ඩලය සාමාන්‍යයෙන් පුද්ගලයන් 3-4 කින් සමන්විත වේ. ප්‍රධාන විමසුම්කරුවා විමසුම සිදු කරන අතර අනෙක් අය සහය ලබාදෙයි. මණ්ඩල ප්‍රධානියා, නීති/ විමර්ශන ක්ෂේත්‍රවල කීර්තිමත් පුද්ගලයන් වන අතර ඔවුන් නීති ඒකකයේ නිර්දේශය මත මණ්ඩල අනුමැතියෙන් පත් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම පරීක්‍ෂණ සමූහ වශයෙන් පැවැත්වීමට මෙම මණ්ඩලය උත්සාහ කරනු ඇත.

විමර්ශනය සඳහා පැමිණෙන විට පහත සඳහන් ලියකියවිලිවලින් හැකි තරම් ප්‍රමාණයක් රැගෙන එන ලෙස පැමිණිලිකරුවන්ට සිහිපත් කෙරිණි:

1. OMP දත්ත ආකෘති පත්‍රය
2. අතුරුදහන් වූ තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය
3. අතුරුදහන් වූ තැනැත්තාගේ උප්පැන්න සහතිකය
4. අතුරුදහන් වූ තැනැත්තාගේ පින්තූරය
5. පැමිණිලිකරුවාගේ ජාතික හැඳුනුම්පත
6. පැමිණිලිකරුගේ උප්පැන්න සහතිකය
7. දිවුරුම් ප්‍රකාශය
8. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ ලිපිය
9. අතුරුදහන් වූ තැනැත්තාගේ විවාහ සහතිකය/ දරුවන්ගේ උප්පැන්න සහතිකය
10. දිවුරුම් සහතිකය (අතුරුදහන් වූ තැනැත්තාට ඇති සම්බන්ධය පිළිබඳ)
11. ග්‍රාම නිලධාරී විසින් අත්සන් කරන ලද ස්ථිර පදිංචිය සම්බන්ධ ලේඛන
12. ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන ලද ස්ථිර පදිංචිය සම්බන්ධ ලේඛන
13. පොලිස් පැමිණිල්ලේ පිටපත
14. ICRC/UNWG පත්‍රිකා
15. වෙනත් කොමිෂන් සභාවල පත්‍රිකා / ලේඛන
16. අතුරුදහන් වූ තැනැත්තාගේ මරණ සහතිකය
17. විවාහ ලියාපදිංචි ලේඛනය
18. CoA (දක්නට නොමැති බවට වූ සහතිකය)
19. අතුරුදහන් වූ තැනැත්තා පිළිබඳ පුවත්පත්වල පළ වූ ලිපි

[11] ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය කාර්යාලයකට කුරියර් මගින් යැවීමට නොහැකි වූ විට, සියලුම අවශ්‍ය තොරතුරු සහිත දත්ත පදනමට ප්‍රවේශය එම කාර්යාලවලට ලබා දෙනු ලැබේ.

20. වෙනත් ඒකක මගින් ඉල්ලූ ලේඛන
21. වෙනත් ලේඛන

පසුව එම විමර්ශන මණ්ඩලය අතුරුදන් වූ පුද්ගලයා සහ එවැනි අතුරුදන්වීම් සම්බන්ධ සිද්ධිය පිළිබඳ තොරතුරු රැස් කිරීමට කටයුතු කරනු ඇත. තුරුදහන් වූ පුද්ගලයා පිළිබඳ පුද්ගලික තොරතුරු, ඔහු/ඇය අතුරුදහන් වූ බවට වාර්තා වූ සහ අවසන් වරට දුටු දිනය / සිද්ධිය පිළිබඳ ඕනෑම තොරතුරක් වැනි තොරතුරු මෙයට ඇතුළත් වේ. අතුරුදන්වූ පුද්ගලයාගේ ඥාතීන් සහ පැමිණිලිකරු ලබාදුන් තොරතුරු මත මෙම විමර්ශනය සිදු කෙරෙනු ලැබේ.

පැමිණිල්ල සමග අතිරේක සාක්ෂිකරුවෙකු පරීක්ෂණයට පෙනී සිටින ලෙස ද පරීක්ෂණ මණ්ඩල ඉල්ලීමක් කරනු ඇත. පැමිණිලිකරු කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු සාක්ෂිකරුවන්ගෙන් වෙන වෙනම විමසා තොරතුරු එකිනෙක තහවුරු කර ගැනීම සඳහා එකම ප්‍රශ්න අසනු ඇත.

පරීක්ෂණයෙන් පසු, පැමිණිලිකරු හට OMP මගින් සැපයිය යුතු දේ කුමක්ද යන්න මණ්ඩලය තීරණය කරනු ඇත. තාවකාලික සහය, COA (දක්නට නොමැති බවට වන සහතිකය), COD (මරණ සහතිකය), වන්දි ගෙවීම් හෝ පුනර්ජීවන ගෙවීම් සහ වෙනත් මනෝ-සමාජ ආධාර යනාදියෙන් සමන්විත වනු ඇත.

විමසුම් මණ්ඩලය ඉන්පසු රහස්‍ය වාර්තාවක් ගොනු කරයි. මෙම වාර්තාව ඒකමතික එකඟතාවයකින් සකස් කරනු ලබන අතර අවශ්‍ය නම් මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ විශ්වාසය නොමැතිකම ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙනු ඇත, මෙය ප්‍රායෝගිකව දුර්ලභ සිදුවීමකි.

OMP හි විධි නියෝගය, පැමිණිලි වර්ග තුනකින් සමන්විත වන අතර එය එහිම නෛතික බලය යටතේ පවතී. ඒවා නම්:

1. සිවිල් යුද්ධය හේතුවෙන් සහ ඒ අතරතුර අතුරුදහන් වූ පුද්ගලයන්
2. ප්‍රධාන දේශපාලන හෝ සමාජ අසහනය හේතුවෙන් සහ ඒ අතරතුර අතුරුදහන් වූ පුද්ගලයන්
3. දේශපාලන හේතු නිසා බලහත්කාරී ලෙස අතුරුදහන් කිරීම්

විමර්ශන වාර්තා අවසන් වූ පසු ඒවා OMP විධිනියෝගය යටතේ වර්ගීකරණය කර ඔවුන් විසින් යෝජනා කරන ලද නිර්දේශ එකතු කිරීමෙන් පසුව, ලිපිගොනු නැවත නීති ඒකකයට යවනු ලැබේ. දත්ත පදනමේ යාවත්කාලීනයන් සම්පූර්ණ වූ පසුව, විමසුම් මණ්ඩලයට ඔවුන් වැය කළ කාලය සහ උත්සාහය සඳහා ප්‍රමාණාත්මක ගෙවීමක් කරනු ලැබේ.

අයදුම්කරුවන් සහ සාක්ෂ්‍යකරුවන්ට ද විමසුම් මණ්ඩලය සිටින ස්ථානය වෙත ප්‍රවාහන වියදම් ලබා දෙනු ලැබේ.

### 8.2 අභියෝග

විමසුම් සම්බන්ධව ගත් කළ මෙම කාලය තුළ දී OMP නිරීක්ෂණය කළ ප්‍රධාන අභියෝගයක් වූයේ පැමිණිලිකරුවන් විමසුමට සහභාගි වීම අවහිර කිරීමට දැඩි උත්සායහක් දරන නොදන්නා පුද්ගලයන් සහ කණ්ඩායම් විසින් විමසුම් පැවැත්වෙන ස්ථාන ඉදිරිපිට රැගෙන ගිය උද්ඝෝෂණ මාලාවයි. එවැනි අසාධාරණ විරෝධතා සඳහා හේතු වන්නේ වන්දි හෝ වන්දි ගෙවීම සහ ජාත්‍යන්තර යුක්තිය සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් වැරදි ලෙස අර්ථකථනය කරන ලද මතවාදයන් ය. කෙසේ වෙතත් සාමකාමී සාකච්ඡාවලින් පසුව මෙම උද්ඝෝෂණ මධ්‍යයේ වුව විමසුම් ක්‍රියාවලින් පවත්වන ලදී.

මෙයට අමතරව, පැමිණිල්ල ශක්තිමත් වන ආකාරයේ ප්‍රමාණවත් සහය ලේඛන නොමැති වීමෙන් සමහර පැමිණිලිකරුවන්ට ලේඛනමය අවශ්‍යතා සැපිරීමට නොහැකි වන බව ද OMP විසින් නිරීක්ෂණය කරන ලදී. එවැනි ලේඛන නොමැති වීම, ක්‍රියාපටිපාටීන්ගේ සුමට ක්‍රියාකාරීත්වයට බලපෑමක් එල්ල කරයි.

### 8.3 මෙතෙක් ප්‍රගතිය

පැමිණිලි වර්ගීකරණයේ 1 වන අදියර යටතේ පැමිණිලි 6025 ක් ලැබී තිබිණි. 2022 දෙසැම්බර් 31 වන විට OMP විසින් විමසුම් 2647 ක් සිදු කර තිබූ අතර ඉන් 2110 ක් 2022 වසර තුළදී සිදු කරන ලද ඒවා වේ. මෙම විමසුම්වලින් පසුව සම්පාදනය කළ පැමිණිලි ගොනු 269 ක් නිර්දේශ සමග රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතත් 218 ක් නිර්දේශ සමග හානිපූර්ණ කාර්යාලය වෙතත් යවන ලදී. ඒ අනුව අදියර 1 යටතේ 3378 විමසුම් ප්‍රමාණයක් සිදු කළ යුතු අතර එය පැමිණෙන වසරේදී සම්පූර්ණ කෙරෙනු ඇත. පශ්චාත් කෝවිඩ් බලපෑම් සහ ජනතාවට නිදහසේ ගමන් කිරීමට හැකිවීම සලකා බැලීමේදී මෙම සංඛ්‍යාව ශක්‍ය බව පැවසිය හැකි ය.

## 9. දත්ත ඇතුලත් කිරීමේ ඒකකය

අතුරුදහන් වූ තැනැත්තන් (OMP) පිළිබඳ කාර්යාලයේ දත්ත කළමනාකරණ ඒකකය (DMU), විස්තීර්ණ දත්ත පදනමක් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීමේ ලා තීරණාත්මක භූමිකාවක් දරයි. DMU හි මූලික වගකීම වන්නේ විමර්ශන ක්‍රියාවලිය පුරා නිවැරදි ලේඛනගත කිරීම, පැමිණිලි සහ ඒවායේ ප්‍රගතිය නිරීක්සුම් කිරීම සහතික කිරීමයි.

DMU විසින් කළමනාකරණය කරන දත්ත පදනම තුළ OMP හට ලැබුණු විවිධ වර්ගයේ පැමිණිලි ඇත. මේවාට සෘජුවම OMP වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි මෙන්ම පොලිසියට ගොනු කරන ලද පැමිණිලි ද ඇතුළත් වේ. මෙම විවිධ තොරතුරු මූලාශ්‍ර ඒකාබද්ධ කිරීම මගින්, DMU විසින් අතුරුදහන් වූවන් පිළිබඳ සිද්ධීන් සම්බන්ධයෙන් පරිපූර්ණ ප්‍රවේශයක් සඳහා පහසුකම් සපයන ඒකාබද්ධ වේදිකාවක් නිර්මාණය කරයි.

2022 මාර්තු මාසයේදී දත්ත පදනම තුළ සෘජුවම OMP වෙත ලැබුණු පැමිණිලිවල සැලකිය යුතු ප්‍රමාණයක් පිළිබිඹු වන අතර මුළු පැමිණිලි ප්‍රමාණය 21,374 ක් වෙයි. මේ මොහොතේ, ප්‍රධාන වශයෙන්ම දත්ත පදනමේ අනුකූලතාව පවත්වා ගැනීමට සහ අවාසනාවන්ත තත්ත්වයන්ට මුහුණ දුන් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් හෝ ඥාතීන් සඳහා යුක්තිය ඉටු කිරීම පිණිස සියලුම පැමිණිලි සම්බන්ධ විමසුම් ආරම්භ කිරීම පිණිස, පැමිණිලි භාරගැනීමේ ක්‍රියාපටිපාටිය තාවකාලිකව නවතා ඇත. මෙම දත්ත කට්ටලය තුළ DMU විසින් ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ (MIA) හෝ OMP හි විධිනියෝගයට නොවැටෙන සිදුවීම්/කිහිප වරක් සිදු කරන ලද පැමිණිලි ලෙස, පැමිණිලි 6,386 ක් හඳුනාගෙන වර්ගීකරණය කර ඇත.

DMU හි ක්‍රියාකාරකම් මූලික වශයෙන් පරිපාලනමය ස්වභාවයක් ගන්නා අතර, දත්ත සමුදාය සූක්ෂම ලෙස සංවිධානය කිරීම, වර්ගීකරණය සහ නඩත්තු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. එක් එක් ඇතුළත් කිරීම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කිරීම මෙන්ම විමර්ශන ක්‍රියාවලිය හරහා ගමන් කරන විට තනි පැමිණිලිවල තත්ත්වය සහ ප්‍රගතිය යාවත්කාලීන කිරීම මෙයට ඇතුළත් වේ.

DMU හි කැපවූ උත්සාහයන් තුළින් දත්ත සමුදාය OMP සඳහා විශ්වාසදායක සහ විස්තීර්ණ තොරතුරු මූලාශ්‍රයක් ලෙස පවතින බව සහතික කරයි. වටිනා සම්පතක් වන මෙම ඒකකය OMP හට අර්ථවත් විදසුන් ලබාගැනීමට, රටා හඳුනා ගැනීමට සහ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් දැනුවත් තීරණ ගැනීමට හැකියාව ලබා දෙයි. DMU විසින් සිදු කරන ලබන වැදගත් වූ පරිපාලනමය කාර්යය OMP හි දත්ත පදනම් එළඹුම සඳහා පදනමක් සකසන අතර ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වෙත වඩා ඵලදායී සහ කාර්යක්ෂම ලෙස සත්‍යය, යුක්තිය සහ සංහිඳියාව ලබා දීමට පහසුකම් සලසයි.

## 10. වින්දිත සහ පවුල් සහය ඒකකය

වින්දිත සහ පවුල් සහය ඒකකය (VFS) OMP හි අත්‍යවශ්‍ය අංගයක් වන අතර, ඔවුන්ගේ ආදරණීයයන් වෙනුවෙන් යුක්තිය ඉල්ලා සිටින පැමිණිලිකරුවන් සම්බන්ධ කර ගැනීමේ පළමු ස්ථානය ලෙස සේවය කරයි. කලාප පහක් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඒකක දෙකක් සහිතව, VFS විසින් පැමිණිලිකරුවන්ට ඔවුන්ගේ ප්‍රකාශ ලබා දීමේදී ආරක්ෂිත සහ සුවපහසුවක් දැනෙන බව සහතික කිරීම සඳහා විවිධ මනෝ සමාජීය ක්‍රම භාවිතා කරයි.

VFS නිලධාරීන් පැමිණිලි ක්‍රියාවලියේ මූලික අඩිතාලම හසුරුවන අතර, OMP මගින් පැමිණිලි විසඳීම සඳහා වඩා හොඳ යාන්ත්‍රණයක් සපයයි. VFS විසින් අතුරුදහන් වීමේ තත්වයන් (COA) සහ අතුරුදහන් වීමට හේතුව (COD) සම්බන්ධයෙන් පැමිණිලිකරුවන්ගේ ප්‍රකාශ මත පදනම්ව ඔවුන්ට ක්‍රියාමාර්ග සහ හානිපූර්ණයන් සම්පාදනය කර නිර්දේශ කරයි.

ආසන්න වශයෙන් කොන්ත්‍රාත් සේවකයින් 200 ක් පමණ සිටින VFS මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ ස්ථිර කාර්ය මණ්ඩලයක් නොමැතිකමයි. කාර්ය මණ්ඩලයේ මෙම අඩුකම හේතුවෙන් දත්ත ඇතුළත් කිරීමේදී සහ ඔවුන්ගේ විෂය පථයට පිටින් වැඩ කිරීමේදී දුෂ්කරතා ඇති කර ඇති අතර, පැමිණිලි සුමටව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා VFS හට දත්ත ඇතුළත් කිරීමේ කාර්යයේ නියැලි පිරිස් සමග එක්ව කටයුතු කිරීමට සිදු විය.

මෙම අභියෝග මධ්‍යයේ වුවද, පැමිණිලිකරුවන්ට ගුණාත්මක සේවාවක් සැපයීමට VFS කැපවී සිටී. පැමිණිල්ල ලැබුණු බව දැන්වීමෙන් පසුව, අයදුම්කරු විසින් සපයනු ලබන තොරතුරු මත පදනම්ව විධි නියෝගය පරීක්ෂා කිරීම සඳහා VSF විසින් අවශ්‍ය ලියකියවිලි ඉල්ලා සිටිනු ලැබේ. පැමිණිල්ල ලැබුණු බව දැන්වීම අරමුණු දෙකක් ඉටු කරයි: පැමිණිලි අංකයක් සැපයීම සහ පැමිණිල්ල ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය ලේඛන ලැයිස්තුව පැහැදිලි කරගැනීම.

2021 වර්ෂයේ සිට ඉදිරිපත් කරන ලද ඉතිරි පැමිණිලි සහ 2022 වසරේ ලැබුණු නව පැමිණිලි ලැබුණු බව දැන්වීම සම්පූර්ණ කිරීමට VFS හට හැකි විය, මෙම පැමිණිලි ක්‍රියාවට නැංවීම අවසන් කිරීම මගින් දත්ත කළමනාකරණ ඒකකයට සහ නීති අංශයට සිය විමර්ශන ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කිරීමට අවකාශය ලැබී ඇත. 2021 සිට 2022 පැමිණිලි ඉදිරිපත් කිරීමේ අවසන් දිනය දක්වා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව ගොනු කළ පැමිණිලි සඳහා ලැබුණු බව දැන්වූ ලිපි 14,988 ක් VFS විසින් යවා ඇති අතර එම කාල සීමාව තුළ ලැබුණු සියලුම පැමිණිලි පරීක්ෂා කිරීම සම්පූර්ණ කර ඇත.

සමස්තයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට යුක්තිය ඉටු කිරීම සඳහා වන OMP හි මෙහෙවර ඉටු කිරීමේ කාර්යය තුළ VFS තීරණාත්මක භූමිකාවක් දරයි. සියලුම පැමිණිලි කාර්යක්ෂමව සහ සාධාරණව ක්‍රියාවට නැංවීම සහතික කිරීමට කැපවෙමින් VFS විසින් වසර පුරාවටම ශ්‍රී ලාංකීය ප්‍රජාවට අත්‍යවශ්‍ය සේවාවක් අඛණ්ඩව ලබා දී ඇත.

වසර තුළ යවන ලද ලැබුණු බව දැන්වීමේ ලිපි සියල්ලේ විස්තර පහත වගුවේ දැක්වේ:

| දිස්ත්‍රික්කය | ලැබුණු පැමිණිලි ගණන | ලැබුණු බවට දන්වා යැවූ පැමිණිලි ගණන | ලැබුණු බවට දන්වා යැවීමට නියමිත පැමිණිලි ගණන (ප්‍රධාන කාර්යාලය) |
|---|---|---|---|
| අම්පාර | 566 | 566 | 00 |

| | | | |
|---|---|---|---|
| අනුරාධපුරය | 273 | 273 | 00 |
| බදුල්ල | 6 | 6 | 00 |
| මඩකලපුව | 4157 | 4157 | 00 |
| කොළඹ | 130 | 130 | 00 |
| ගාල්ල | 297 | 297 | 00 |
| ගම්පහ | 261 | 261 | 00 |
| හම්බන්තොට | 393 | 393 | 00 |
| යාපනය | 2106 | 2106 | 00 |
| කලුතර | 190 | 190 | 00 |
| මහනුවර | 582 | 582 | 00 |
| කෑගල්ල | 109 | 109 | 00 |
| කිලිනොච්චිය | 1010 | 1010 | 00 |
| කුරුණෑගල | 387 | 387 | 00 |
| මන්නාරම | 488 | 488 | 00 |
| මාතලේ. | 292 | 292 | 00 |
| මාතර | 555 | 555 | 00 |
| මොණරාගල | 76 | 76 | 00 |
| මුලතිවු | 528 | 528 | 00 |
| නුවරඑළිය | 16 | 16 | 00 |
| පොළොන්නරුව | 343 | 343 | 00 |
| පුත්තලම | 85 | 85 | 00 |
| රත්නපුරය | 221 | 221 | 00 |
| ත්‍රිකුණාමලය | 1349 | 1349 | 00 |
| වව්නියාව | 568 | 568 | 00 |
| එකතුව | **14,988** | **14,988** | **00** |

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණි පවුල් ගණන පහත දක්වා ඇත.

| මාසය **(2022)** | ප්‍රධාන කාර්යාලය වෙත පැමිණි පවුල් ගණන |
|---|---|
| ජනවාරි | 04 |
| පෙබරවාරි | 02 |

| | |
|---|---|
| මාර්තු | 08 |
| අප්‍රේල් | 03 |
| ජූනි | 01 |
| ජූලි | 03 |
| අගෝස්තු | 02 |
| සැප්තැම්බර් | - |
| ඔක්තෝබර් | 04 |
| නොවැම්බර් | - |
| දෙසැම්බර් | 01 |
| එකතුව | **28** |

### 10.1. අතුරුදහන් පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍රය

අතුරුදහන් වූවන්ගේ තොරතුරු රැස් කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් භාවිතා කළ අතුරුදහන් වූවන්ගේ දත්ත ආකෘතිය අදියර කිහිපයකට බඳුන් වී ඇත. 2018 දී නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලදුව 2019 ප්‍රතිපෝෂණ මත පදනම්ව යාවත් කරන ලද අතුරුදහන් වූ පුද්ගලයන්ගේ දත්ත ආකෘති පත්‍රය 2022 දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර එය වර්තමානයේදී භාවිතා කෙරේ. මෙම ආකෘති පත්‍රය සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ලද හැකි ය. අතුරුදහන් වූ තැනැත්තෙකු පිළිබඳව වාර්තා කිරීමට අවශ්‍ය මෙම අවම තොරතුරු පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ සන්දර්භයන් සහ අවශ්‍යතාවයන්ට අනුකූලව එය සංවර්ධනය කරනු ලැබුවේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වූවන් පිළිබඳ සරල දත්ත ආකෘති පත්‍රය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයීය මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව සිංහල , දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දෙන ලදී.

### 10.2 VFS සහ බාහිර සහයෝගීතාවන්

වින්දිතයන් සහ පවුල් සඳහා වන එහි කාර්යභාරයට අමතරව, OMP අතුරුදහන් වූවන්ගේ සිද්ධීන්වලට අදාළ අමතර තොරතුරු රැස් කිරීම සඳහා විවිධ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය පොලිසිය සමග ක්‍රියාකාරීව සම්බන්ධ වී OMP විසින් එක් එක් සිද්ධිය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට දායක වන වටිනා දැනුම සහ දත්ත ලබා ගනී.

අතුරුදහන් වූවන්ගේ පවුල් සම්බන්ධ කර ගැනීමේ වැදගත්කම හඳුනා ගනිමින් OMP ඔවුන් සමග සමීප සන්නිවේදනයක් පවත්වයි. ආධාරක සහ සංවේදී පරිසරයක් ස්ථාපිත කිරීමෙන්, OMP විසින් පවුල්වල හඬට සවන් දීම සහ ඔවුන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීම සහතික කරයි. මෙම සහයෝගී ප්‍රවේශය OMP හට පවුල්වලින් තීරණාත්මක තොරතුරු රැස් කිරීමට උපකාරී වන අතර එමගින් විමර්ශන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් වී දත්තවල සමස්ත ගුණාත්මක භාවය ඉහළ නැංවේ.

කාර්යක්ෂම දත්ත කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා OMP හි වින්දිත සහ පවුල් සහය ඒකකය නීතිමය ඒකකය සමග එක්ව කටයුතු කරයි. විමර්ශන ක්‍රියාවලියට සම්බන්ධ වූ මණ්ඩල සාමාජිකයින් සඳහා අත්‍යවශ්‍ය මෙවලම් සහ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමේදී නීති ඒකකය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එයට, විස්තීර්ණ චර්යාධර්ම සංග්‍රහයක් සැකසීම, ක්‍රියා පටිපාටි මාර්ගෝපදේශ, පිරික්සුම් ලැයිස්තු සහ සිද්ධි කළමනාකරණ ශිල්පීය ක්‍රම සැකසීම ඇතුළත් වේ. නීත්‍යානුකූල සහ සදාචාරාත්මක ප්‍රමිති ට අනුගත වෙමින්,

විමර්ශන ක්‍රියා පටිපාටි විනිවිදභාවයෙන්, ක්‍රමානුකූලව සහ වගවීමකින් සිදු කෙරෙන බව මෙමගින් සහතික කෙරේ.

වින්දිත සහ පවුල් සහය ඒකකය, නීති ඒකකය සහ අදාළ බලධාරීන් සමග සහයෝගීතා හවුල්කාරිත්වය යනාදියේ ඒකාබද්ධ උත්සාහයන් තුළින් OMP ශක්තිමත් සහ විශ්වාසදායක දත්ත කළමනාකරණ පද්ධතියක් ගොඩනැගීමට උත්සාහ කරයි. ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා සත්‍ය සෙවීම, යුක්තිය සහ ප්‍රතිසන්ධානය යන OMP හි මෙහෙවර ඉදිරියට ගෙන යාම සඳහා, නිවැරදි ලේඛනගත කිරීම, කාර්යක්ෂම විශ්ලේෂණය සහ දැනුවත් තීරණ ගැනීම සඳහා මෙම ක්‍රමය ඉඩ සලසයි.

## 11. මූල්‍ය හා ප්‍රසම්පාදන ඒකකය

2022 වසර සඳහා විගණිත මූල්‍ය වාර්තා මේ සමග අමුණා ඇත. කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ වසංගතය ආශ්‍රිත සීමා කිරීම් හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට සැලසුම් කර ඇති පරිදි වැඩසටහන්කරණය සහ පරිපාලන කටයුතු යන දෙකෙහිම සිය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. එබැවින්, විගණනය කරන ලද ගිණුම් සඳහා කාර්යාලයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සභාපතිවරයා විසින් වසර අවසානයේදී මූල්‍ය හා ප්‍රසම්පාදන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම ආරම්භ කරන ලදී (ඇමිණුම 1 බලන්න)

## 12. මානව සම්පත් සහ පරිපාලන ඒකක

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, තම කොළඹ ප්‍රධාන කාර්යාලය මෙන්ම කිලිනොච්චිය, මාතර, මන්නාරම, යාපනය සහ මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලවල මෙහෙයුම් කටයුතු සම්පූර්ණයෙන්ම සිදු කිරීමට කැප වීමෙන් කටයුතු කළේ ය. ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම හේතුවෙන් බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල පවුල් වෙත පහසුවෙන් ළඟා වීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකියාව ලැබී ඇත. බලපෑම් ලත් පවුල් සමග කටයුතු කිරීමේදී සංවේදීව සහ ඔවුන්ගේ ගරුත්වය රැකෙන පරිදි කටයුතු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කැපවී කටයුතු කරයි.

ප්‍රධාන තනතුරුවලට පත් වූ සේවක මණ්ඩලය රඳවා තබාගැනීම සැලකිය යුතු අභියෝගයක් වූ අතර විවිධ රීති සහ රෙගුලාසි නිසා අයවැය යටතේ වෙන් කරන ලද අරමුදල් සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව අඩු වී තිබිණි. මීට අමතරව 2022 මැද භාගයේදී රටට මුහුණ දීමට සිදු වූ ආර්ථික අර්බුදය හේතුවෙන් බඳවාගැනීම්වලින් සලකිය යුතු ප්‍රමාණයක් නතර විය. ක්ෂේත්‍රවල විශේෂඥයින් ලබා ගැනීමට ඇති නොහැකියාව වසරේ සැලකිය යුතු කාලයක් සඳහා OMP හි ක්‍රියාකාරිත්වය අඩපණ කළේය.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ස්ථාපිත කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ උපාය මාර්ගික සංවර්ධනය සම්බන්ධව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරව රැස්වූ අතර ඉන්ධන අර්බුදය සහ ආර්ථික අවපාතය යන අභියෝග මධ්‍යයේ 2022 වසර තුළ පැවැත්වූ රැස්වීම් ගණන 21 ක් විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී OMP අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ, උපාය මාර්ගික, ශ්‍රම බලකාය ප්‍රතිව්‍යුහගත කිරීම, විමසුම් ක්‍රියාවලිය සහ ධාරිතා ගොඩනැගීම වැනි පුළුල් පරාසයක මාතෘකා පිළිබඳව සාකච්ඡා කළහ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කළ අතර ප්‍රධානීන් පත් නොකළ ඒකකවල කටයුතු , හෝ ස්ථාපනය නොකළ ඒකකවල කටයුතු සඳහා කාර්ය මණ්ඩලය සමග එක්ව වැඩ කළහ. තවද, කොමසාරිස්වරු න් විමසුම් සිදු කිරීම

සහ ක්ෂේත්‍ර චාරිකාවල නියැලුණු අතර පවුල්, සිවිල් සමාජය සහ වෙනත් රාජ්‍ය නිලධාරීන් සමග අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සේවාවන් වැඩි දියුණු කිරීම සම්බන්ධව කටයුතු කළේ ය.

### 12.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ දින සිට, එහි තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පළපුරුද්දක් ඇති සුදුසුකම් ලත් සේවකයින් බඳවා ගැනීම සඳහා සැලකිය යුතු කාලයක්, ශක්තියක් හා සම්පත් වැය කර ඇත. වසර තුළ අවධානය යොමු වූ ප්‍රධාන කරුණක් වූයේ අනුමත සේවක සංඛ්‍යාව 255 ක් සිටින නමුත් ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් සේවකයන් සිටිනුයේ 24 ක් පමණක් බවත් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනමෙන් සිටින බවත් ය. කොන්ත්‍රාත් පදනමින් 2022 වසරේ සිදු කළ වැදගත්ම බඳවා ගැනීම වූයේ විධායක අධ්‍යක්ෂවරයා ලෙස ජෙගනාදන් තත්පරන් මහතා බඳවා ගැනීමයි. මීට අමතරව රියැදුරෙකු සහ කළමනාකරණ සහකාරවරයෙකු වසරක කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබිණි.

වාර්තාකරණ කාලය තුළ කිසිදු නව තනතුරක් නිර්මාණය නොකරන ලද අතර OMP විසින් පද්ධතියට නව නෛතික සහ ප්‍රතිපත්ති වෙනස්කම් කිසිවක් සිදු නොකළේ ය.

වසර පුරා මහේෂ් කටුලන්ද මහතා සභාපතිත්වය දරන ලද අතර 2022 අප්‍රේල් 28 වනදා ශිරාස් නූර්දීන් මහතා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය. එමෙන්ම වෙනත් වෘත්තීය අවස්ථාවක් සඳහා ජේ වික්‍රමසිංහ මහතා ද අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් විය. 2022 වසර සඳහා ස්ථාපිත කළ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ:

| # | : සම්පූර්ණ නම | තනතුරුනාමය |
|---|---|---|
| 1 | මහේෂ් කටුලන්ද මයා AAL | සභාපති |
| 2 | විජේකෝන් බණ්ඩාර ගනේගල මයා | මණ්ඩලීය සාමාජික |
| 3 | සිති ඩේන් අර්ෆා සතීම් මෙය | මණ්ඩලීය සාමාජික |
| 4 | තම්බයියා යෝගරාජා මයා | මණ්ඩලීය සාමාජික |
| 5 | පී.එම්.ඩබ්. සම්පත් පෙරේරා මයා | මණ්ඩලීය සාමාජික |
| 6 | මාධව ජයවර්ධන මයා | මණ්ඩලීය සාමාජික |
| 7 | ජයන්ත වික්රමසිංහ මයා | මණ්ඩලීය සාමාජික |

## 13. සන්නිවේදන සහ සම්බන්ධතා ඒකකය

OMP හි විධිනියෝගය වන්නේඅතුරුදහන් වූ පුද්ගලයින් සම්බන්ධ සිදුවීම්වලට පසුබිම් වූ හේතු මෙන්ම ඒවායේ බලපෑම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ ඔවුන්ගේ පවුල්වලට උපකාර කිරීම සඳහා සහයෝගය ලබා දීමයි. 2018 දී OMP පිහිටුවීමේ සිට, OMP හි මෙහෙවර සහ වැඩ කටයුතු පිළිබඳව දැනුවත්

කිරීම, අතුරුදහන් වීමේ බලපෑම් පිළිබඳව දැනුවත් කිරීම; අතුරුදහන් වූවන් ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යයේ සහ සමාජයේ වගකීම ඉස්මතු කිරීම සහ OMP සම්බන්ධයෙන් ඇති වැරදි වැටහීම් වැලැක්වීම සඳහා සන්නිවේදන උපාය මාර්ගයක් සකස් කර ඇත; මෙය සිදු කිරීම සඳහා, OMP විසින් භෞතික සහ ඩිජිටල් මාධ්‍ය හරහා තොරතුරු ලබා දීම තුළින් අතුරුදහන් වූවන්ගේ පවුල්වලට, වැදගත් පාර්ශවකරුවන්ට සහ සාමාන්‍ය ජනතාවට OMP හි ක්‍රියාකාරකම් සම්බන්ධව දැනගැනීමට ඉඩ සලසා ඇත.

සන්නිවේදන සහ සම්බන්ධතා ඒකකය තවමත් ස්ථාපිත කර නොමැති නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ තනි ඒකක සඳහා ලබා දී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව සුදුසු ඒකක මගින් සියලු කටයුතු සිදු කර අධීක්ෂණය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මාධ්‍ය සාකච්ඡා, මාධ්‍ය සංදර්ශන සහ ලිඛිත හා වාචික සන්නිවේදනයන් කළමනාකරණය කළහ.

### 13.1මාධ්‍ය සමග සම්බන්ධතා

බලහත්කාරී අතුරුදහන් කරනු ලැබීමේ වින්දිතයන්ගේ ජාත්‍යන්තර දිනය සැමරීම සඳහා අගෝස්තු 30 වන දින මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලදී. රටේ පැවති වාතාවරණය හේතුවෙන් OMP ට තවත් පොදු උත්සව පැවැත්වීමට නොහැකි විය.

### 13.2 ඩිජිටල් පැවැත්ම

ඩිජිටල් වේදිකා හරහා මහජනතාව සමග සම්බන්ධ වීම පිණිස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය Twitter සහ Facebook සමාජ මාධ්‍ය ගිණුම් සැකසීය. 2022 දෙසැම්බර් 31 වන විට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ට්විටර් හි අනුගාමිකයන් 2088 ක් සහ ෆේස්බුක් හි අනුගාමිකයන් 5000 ක් සිටියහ.

## 14. තොරතුරු දැනගැනීමේ අයිතිය

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතු තොරතුරු වෙත පිවිසීම ලබා දිය යුතු ය. පහත වගුව මගින් 2022 වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාත්මක කළ ආකාරය දක්වා ඇත:

| අංකය | විෂය | ප්‍රමාණය |
|---|---|---|
| **1** | **2022 වසර තුළ තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව** | **08** |
| **2** | තොරතුරු සම්පූර්ණ වශයෙන් ලබා දුන් ඉල්ලීම් ගණන | **06** |
| **3** | තොරතුරු අර්ධ වශයෙන් ලබා දුන් ඉල්ලීම් ගණන | **00** |
| **4** | පනතේ 5 වන වගන්තිය අනුව ප්‍රතික්ෂේප කරන ලද හෝ රඳවන ලද තොරතුරු ඉල්ලීම් ගණන | **02** |
| **5** | පනතේ 5 වන වගන්තියේ සඳහන් හේතු හැර වෙනත් හේතුනිසා ප්‍රතික්ෂේපිත තොරතුරු ඉල්ලීම් ගණන (උදා. තොරතුරු නොමැති වීම) | **00** |

| | | |
|---|---|---|
| **6** | තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට ගන්නා ලද කාලය (වැඩ කරන දින ගණන) කොපමණ ද? | දින 14 |
| **7** | තැපෑලෙන් කෙතරම් තොරතුරු ඉල්ලීම් ප්‍රමාණයක් ලැබුණේ ද? | 05 |
| **8** | ඊමේල් මගින් කෙතරම් තොරතුරු ඉල්ලීම් ප්‍රමාණයක් ලැබුණේ ද? | 00 |
| **0** | තැපෑල හෝ ඊමේල් හැර වෙනත් ආකාරයකින් කෙතරම් තොරතුරු ඉල්ලීම් ප්‍රමාණයක් ලැබුණේ ද? | 00 |

## 15. 2022 වසරේ අභියෝග

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 11 (අ) වගන්තිය, 2017 සංශෝධනය (2017 අංක 09) මගින් අවලංගු කිරීමත් සමග ප්‍රතිපත්තිමය වශයෙන් අභියෝගයන් එල්ල විය. මෙම සංශෝධනය අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමේ අසීරුතාවන් ඇති විය. මක් නිසාද යතහොත් කිසියම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් සමග ගිවිසුමකට එලඹීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධි නියෝගය සැපිරිය යුතු වීම නිසා ය.

එමෙන්ම,අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සීමිත මානව සම්පත නිසාද බරපතල අභියෝගයන්ට මුහුණ දෙයි. ස්වාධීන ආයතනයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි නායකත්වය වෙනස්වීම මත දැඩි අභියෝගයන් රැසකට මුහුණ දුන්නේ ය. තවත් ප්‍රධානතම අභියෝගයක් වූයේ අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීමයි. වසරේ අවසන් කාර්තුව තුළ නව සභාපතිගේ නායකත්වය සමග අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අධිකරණ අමාත්‍යාංශය සහ වෙනත් අමාත්‍යාංශ සහ පාර්ශ්වකරුවන් සමග මෙම අභියෝග ජනයගැනීම සඳහා සමග හිතකර සංවාදයන්හි නියැළුණේ ය.

## 16. ඇගයීම

අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2022 වර්ෂයේදී උපරිම සහයෝගය ලබා දුන් අපගේ සියලුම හවුල්කරුවන්ට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අපි අවංක ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමු. රජය, අමාත්‍යවරයා, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය, නීතිපති කාර්යාලය, සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරීන් වෙතින් ලැබුණු නොමඳ සහයෝගය වෙනුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කෘතඥ පූර්වක වෙයි. එජා සංවිධානය, යුරෝපා සංගමය සහ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය ඇතුළු රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව සහ සංවර්ධන හවුල්කරුවන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ උපරිම සහාය ලබා දී ඇති අතර, ඔවුන්ගේ සහයෝගය කෘතඥතාවයෙන් යුතුව සටහන් කිරීමට කාර්යාලය අපේක්ෂා කරයි. 2022 දී ලබා දුන් සහයෝගය වෙනුවෙන් පවුල් සංගමයට සහ ආගමික නායකයින්ට ස්තුති කිරීමටද අපි අපේක්ෂා කරමු. ඔවුන්ගේ මැදිහත්වීම් නොවන්නට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට මෙතරම් දුරක් පැමිණිය නොහැකි වනු ඇත. මාධ්‍ය, මාධ්‍යවේදීන් සහ උගත් බුද්ධිමතුන් විසින් ලබාදුන් දිරිගැන්වීම ප්‍රශංසනීය වූ අතර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල ඔවුන්ට ස්තූතිය පුද කරයි. අවසාන වශයෙන්, 2022 වසර ජයග්‍රහණයේ වසරක් බවට පත් කිරීමට අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල කණ්ඩායම, ස්වේච්ඡා සේවකයන් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් දරන ලද නොපසුබට උත්සාහය අගය කළ යුතු වෙයි.

## 17. විගණන ප්‍රකාශය

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/F/OMP/FS/01/2022 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 මැයි 19 දින

සභාපති,

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා මතය වේ.

### 1.2.1 තක්සේරුගණනය කළ මතය සඳහා පදනම

(i) අනුගමනය කරන ලද ගිණුම් ප්‍රමිතිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද කාර්යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර ඇති බැවින් ඒ පිළිබඳ ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ වාහන දීමනා වියදම රු.2,383,333 ක් වුවද රු.2,433,633 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වාහන දීමනා වියදම රු.50,300 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි.

(iii) 2021 දෙසැම්බර් මාසයට අදාලව සභාපති ඇතුළු අනෙකුත් කොමසාරිස්වරුන් සඳහා ගෙවිය යුතුව තිබූ මාසික දීමනාව වූ රු.169,840 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මාසික දීමනා වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(iv) 2021 වර්ෂයට අදාල වියදම් අයිතම 9 ක් සඳහා ගෙවන ලද රු.366,551 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් වල දක්වා තිබුණි.

(v) සමාලෝචිත වර්ෂයට අදාල කාර්යාල උපකරණ ක්ෂය රු.477,600 ක් වුවද රු.469,750 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.7,850 ක් ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.

(vi) කාර්යාලයෙහි ගිණුම් පොත්වලට රථවාහනවල වටිනාකම ඇතුලත් කර නොතිබුණද සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාලය විසින් වාහන තුනක් සඳහා අළුත්වැඩියා වියදම් ලෙස රු.302,722 ක මුදලක් දරා තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු.3,843,088 ක් වූ උපචිත වියදම් ලේඛනයට අනුව වර්ෂය තුලදී කවදුරටත් රු.67,183 ක උපචිත වියදම් එකතුවී තිබූ අතර එම එකතු වූ වටිනාකමට අදාල අනෙක් සවහන පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවිය. තවද වර්ෂය තුල උපචිත වියදම් රු.3,446,513 ක් පියවා වර්ෂ අවසානයට රු. 463,758 ක් උපචිත වියදම් ලෙස දැක්වූ නමුත් එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කරනු වෙනුවට ශුද්ධ වත්කම්වලට එකතු කර තිබුණි.

(viii) 2021 දෙසැම්බර් 31 දිනට හානිපූර්ණ කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතුව තිබූ රු.663,015 ක මුදල සමාලෝචිත වර්ෂයේදී හානිපූර්ණ කාර්යාලයෙන් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ශුද්ධ වත්කම්වලින් අඩුකර කපා හැරීම හේතුවෙන් ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. තවද අදාල මුදල කපා හැරීමට ලද අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

(viii) 2021 දෙසැම්බර් 31 දිනට හානිපූර්ණ කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතුව තිබූ රු.663,015 ක මුදල සමාලෝචිත වර්ෂයේදී හානිපූර්ණ කාර්යාලයෙන් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ශුද්ධ වත්කම්වලින් අඩුකර කපා හැරීම හේතුවෙන් ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. තවද අදාල මුදල කපා හැරීමට ලද අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට

වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට කාර්යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 | |
| (i) 9.1 (ආ) පරිච්ඡේදය | කාර්යාලය විසින් මාණ්ඩලික තත්ත්වයේ නොවන නිලධාරීන් වෙත අවස්ථා 8 කදී එකතුව රු. 571,730 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. |
| (ii) 9.1 (ආ) සහ මු රෙ 371 (5) | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නිලධාරීන් අවස්ථා 14කදී ලබාගත් අතුරු අග්‍රිම පියවීමට දින 21 සිට 245 දක්වා කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි. |

| | | |
|---|---|---|
| | (iii) 9.1 (ආ) සහ මු රෙ 371 (2) | මුදල් රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 22 කදී නිලධාරීන් 11 කට එකතුව රු. 11,892,081ක් වූ අතුරු අග්‍රිම ලබා දී තිබුණි. |
| | (iv) 9.1 (ආ) පරිච්ඡේදය | රු.100,000 ඉක්මවා අවස්ථා 22 කදී රු.11,892,081 ක් වූ අතුරු අග්‍රිම ලබා දී තිබූ අතර ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (v) 9.1 (ඇ) සහ මු රෙ 371 (4) | ගණන්දීමේ නිලධාරියා විසින් වුවද, නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු යැයි සඳහන් වුවද, එක් නිලධාරියකු විසින් 2022 ජනවාරි 24 දින ලබාගෙන තිබූ රු. 25,000 ක මුදල වැය කිරීමකින් තොරව 2022 පෙබරවාරි 10 දින ආපසු මුදලින් පියවා තිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3 ඡේදය | කාර්යාලය භාවිතා කරන වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛය පරිදි ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2019 මැයි මස 31 දිනැති අංක 13/2008 (v) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i) චක්‍රලේඛයේ කොන්දේසි උල්ලංඝණය කරමින් නිලධාරීන් දෙදෙනෙකුට රු.47,995 ක ඉන්ධන දීමනා වැඩිපුර ගෙවා තිබුණි.<br>(ii)පෙට්‍රල් ලීටරයක මිල රු.254 ක්ව පැවතියදී රු.338 ක් ලෙස ගණනය කිරීම හේතුවෙන් අප්‍රේල් මස නිලධාරියෙකු වෙනුවෙන් රු.12,180 ක් දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද PE/COP/POLI/CIRCULARS හා 2015 මැයි මස 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ PED1/2015 හි 3.5 ඡේදය | (i) කාර්යාලයෙහි ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ලබාගන්නා නිලධාරීන් හතරදෙනෙකු සංචිත වාහන භාවිතා කිරීමේදී චක්‍රලේඛ උපදෙස් අනුගමනය කර නොතිබුණි.<br>(ii) 2022 ජනවාරි 25 සිට පෙබරවාරි 01 දක්වා උතුරු පලාතේ පැවති ජංගම සේවයකට සහභාගිවීම සඳහා ප්‍රවාහන දීමනාව ලබා ගන්නා කාර්යාල නිලධාරීන් දෙදෙනෙකු විසින් කාර්රථ |

| | | |
|---|---|---|
| | | දෙකක් පුද්ගලික ආයතනයකින් කුලියට ලබාගෙන තිබු අතර ඒ සඳහා රු. 141,860 ක මුදලක් කාර්යාලය විසින් ගෙවා තිබුණි. |
| (ඉ) | රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i)මු.රෙ 1646 | අතුරුදහන්වුවන්ගේ කාර්යාලය සතුව පවතින වාහන තුනක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii)මු රෙ 1645 (අ) | කාර්යාලය භාවිතා කරන වාහන සඳහා මුදල් රෙගුලාසි පරිදි ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. |
| | (iii)මු.රෙ. 110 | මුදල් රෙගුලාසි පරිදි හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | (iv) මු. රෙ. 315<br>මු. රෙ. 880<br>2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදය | ඇප තැන්පත් කළ යුතු කාර්යාල නිලධාරින් ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (v)මු.රෙ. 395 (ආ) | පිළියෙල කරන ලද බැංකු සැසඳුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන ආයතනික පාලනය පිළිබඳව මාර්ගෝපදේශය | |
| | (i) 04 පරිච්ඡේදය | මාර්ගෝපදේශය පරිදි විගණන කමිටු පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 16 (2) | පනත ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

2.2.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය සහ කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය හා කර්තව්‍ය ඉටු කිරීම) පනතේ II කොටසේ 10 (1) හි දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීම සඳහා කාර්යාලයේ ප්‍රධාන අංශ 3ක් වන සෙවීම් හා විමර්ශන, සන්නිවේදන හා සමාජ සම්බන්ධීකරණ සහ මුදල් හා ප්‍රසම්පාදන අංශයන් සෘජුව සම්බන්ධ වීම | 2022 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට එම අංශ මඟින් ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් ඇතුලත් කර නොතිබුණි. ආයතනය පිහිටුවීමේ මූලික පරමාර්ථය ඉටු කර ගැනීමට අත්‍යවශ්‍ය වන මෙම අංශ ක්‍රියාත්මක නොවීම හේතුවෙන් කාර්යාලයේ අරමුණු හා ඉලක්ක සාරා ලඟාවීමට නොහැකිවී ඇති බව නිරීක්ෂණය විය. |
| (ආ) 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමට අදාල පනතේ ප්‍රධාන කාර්යයන් අතරට අතුරුදන් වූ තැනැත්තන් සම්බන්ධ සිදුවීම් පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාල බලධාරියා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම හා අතුරුදහන් වූ තැනැත්තන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ආරක්ෂා කිරීම. | කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දක්වා ලැබී තිබූ මුළු පැමිණිලි ගණන 14,988 ක්වූ අතර එදිනට විසඳන ලද පැමිණිලි ගණන 2389 ක් විය. ඒ අනුව ලැබී තිබූ මුළු පැමිණිලි ගණන හා සසඳන විට විමර්ශණය කරන ලද පැමිණිලි ගණන සියයට 15 වැනි අඩු මට්ටමක පැවතිණි. |

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2022 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ රු.5,425,000 ක්වූ කාර්යයන් 15 කට අදාලව කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුල සිදුකර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පිළිබඳව පරීක්ෂා කිරීමේදී කාර්යාලයෙහි අංශ 5කට අදාල කාර්යයන් 21 ක් සඳහා නිසියාකාරයෙන් ඇස්තමේන්තු කිරීමක් කර නොතිබූ අතර එහි ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම තුළ බොහෝ කාර්යයන්වල භෞතික ප්‍රගතියක් පැවතියද, මූල්‍ය ප්‍රගතිය සඳහන් කිරීමක් කර නොතිබුණි.

(ඈ) 2022 වර්ෂය තුලදී රු. 9,000,000 ක් වැයකර විමර්ශන අංශයේද සහයෝගය සමඟ විමර්ශන පැවැත්වීම සහ ලිපිගොනු 9000 ක් යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබූ අතර මින් වර්ෂය අවසාන වන විට රු.20,580,368 ක් වැයකර ලිපිගොනු 2389 ක් පමණක් යාවත්කාලීන කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ මුදලට වඩා සියයට 226 කින් සත්‍ය මුදල වැඩි වී තිබූ අතර ඒ අනුව නිසියාකාරයෙන් මුදල් ඇස්තමේන්තු කිරීමක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) කාර්යාලයේ මානව සම්පත් හා පාලන අංශය විසින් නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට රු.148,638 ක මුදලක් ගෙවා තිබුණද වර්ෂය තුල කිසිදු විභාගයක් පවත්වා නොතිබුණි.

## 2.3 වෙනත් කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මඩකලපුව හා මාතර ප්‍රාදේශීය කාර්යාල සඳහා පිළිවෙලින් රු. 100,000 ක හා රු.150,000 ක මාසික කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පිළිවෙලින් 2022 අගෝස්තු මස හා 2022 ජූනි මස බදු ගිවිසුම් අවසන් වුවද, නැවත එම බදු ගිවිසුම් අලුත් කිරීමට හෝ වෙනත් ගොඩනැගිලිවලට මාරුවීමට හෝ කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනයට සම්බන්ධ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි 2 ඡේදයට අනුව රාජ්‍ය වියදම් සීමාකිරීම රාජ්‍ය ආයතන විසින් දැඩිව අනුගමනය කළ යුතුයැයි සඳහන් කර තිබුනද ඊට පටහැනි වියදම්ද ඇතුළුව ප්‍රාදේශීය කාර්යාල පහක් සඳහා කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.20,629,346 ක වියදම් දරා තිබුණු අතර වර්ෂය තුලදී මෙම ප්‍රාදේශීය කාර්යාල සඳහා පැමිණිලි 274 ක් පමණක් සටහන් කර ගැනීම සිදුකර තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුල භාෂා පරිවර්තකයින් 7 දෙනෙකු සිටියද, එක් අයෙකු හෝ බඳවා නොගැනීම හේතුවෙන් 2022 වර්ෂයේදි බාහිරව තෝරාගත් භාෂා පරිවර්තකයින් දස දෙනෙකු වෙත රු. 3,082,880 ක මුදලක් භාෂා පරිවර්තන ගාස්තු ලෙස ගෙවා තිබුණි.

(ඈ) කාර්යාලය විසින් 2022 වර්ෂය තුළ ගොඩනැගිලි කුලී ලෙස රු. 22,377,622 ක් බාහිර පාර්ශවයකට ගෙවා තිබුණු අතර මීට අමතරව මෙම ගොඩනැගිල්ල සඳහා වර්ෂය තුළ පිරිසිදු කිරීමේ සේවා ගාස්තු, ආරක්ෂක සේවා, පවිත්‍රතා කටයුතු, ජලය හා විදුලිය ලෙස රු. 4,620,934 ක් ගෙවා තිබුණි. මෙම වියදම් නිලධාරින් 15 ක් වැනි සුළු සංඛ්‍යාවක් වෙනුවෙන් දරන ලද වියදම් බව අනාවරණය විය.

(ඉ) කාර්යාලය ආරම්භයේදි නිලධාරින් 255ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද මෙම ආයතනයෙහි කටයුතු වර්තමානය වන විට නිලධාරින් 31 ක් වැනි අවම සංඛ්‍යාවක් මඟින් කළමනාකරණය කර ගනු ලබන බැවින් අදාල පහසුකම් ඇති කිරීමේදි මෙම කාරණය පිළිබඳ සලකා බලා නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති